# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,946 - 2015 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2015.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1366 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1369 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 දෙසැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1363- B 81013—5,402 (2015/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 19 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල නගරය නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

12-508

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 19 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | හඟුරන්කෙත | නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත නගරය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

12-509

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — වවුනියාව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 දෙසැම්බර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| වවුනියාව | වවුනියාව දකුණ | කිලක්කුමුලයි දකුණ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය/උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |
| වවුනියාව | වවුනියාව දකුණ | මාමඩුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය/උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |
| වවුනියාව | වවුනියාව උතුර | මාලේපත්තු නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |
| වවුනියාව | වවුනියාව | නාඩුවෙට්ටිකුලම් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ වවුනියාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව. |

12-518

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 19 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ කන්දෙවත්ත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ හිරිඹුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

12-510

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 19 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අම්පාර | අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර නගර කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

12-512

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 ජනවාරි මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 නොවැම්බර් මස 27 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | බේරුවල | කළුතර පානදුර හා තොටමුණ කොට්ඨාසයේ දර්ගා නගරය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

12-511

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2016**

අංක 1,884 හා 2014.10.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2013 (2014) අයදුම්පත් කැඳවීමේ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

02. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති අම්පාර, අනුරාධපුරය, මහනුවර තාක්ෂණ විද්‍යාලවල හා මොණරාගල, වීරවිල කාර්මික විද්‍යාලවල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 1. සංචාරක බංගලා භාරකරු | 05 |

01. බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව වෘත්තීය පරීක්ෂණයක් පවත්වනු ලබන අතර වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

*වෘත්තීය පරීක්ෂණය :*

| | කාලය පැය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| 1. | 02 | 100% | 40% | 1. ගෘහ පාලනය<br>2. ආහාර සැකසීම<br>3. ආහාර පිළිගැන්වීම<br>4. පිරිසිදු බව/සැලකිලිමත් බව |

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 50 |
| අතිරේක පළපුරුද්ද | 25 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 |
| එකතුව | 100 |

02. අධ්‍යාපන සුදුසුකම් : අ. පො. ස. (සා. පෙ.) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන (02) ක් සහිතව විෂයයන් හය (06)කින් සමත් වී තිබීම.

03. වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) 2 මට්ටමට නොඅඩු, තනතුරට අදාළ ක්ෂේත්‍රය යටතේ පහත සඳහන් පරිදි ප්‍රවීණතාවක් අත්කර ගෙන තිබිය යුතු ය.

1. හෝටල් පාසල මගින් ගෘහ පාලනය හෝ සූප ශාස්ත්‍රය පිළිබඳව පවත්වන හය මාසික පාඨමාලාවක් හදාරාලත් සහතිකය;

*හෝ*

2. වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වන ගෘහ පාලනය හෝ සූපවේදය පිළිබඳ හය මාසික පාඨමාලාවක් හදාරාලත් සහතිකය;

*හෝ*

3. රජයේ හෝ රජය පිළිගත් ආයතනයක් විසින් පවත්වන මාස 06කට නොඅඩු ගෘහ පාලනය හෝ සූපවේදය පිළිබඳ පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.

04. සේවා පළපුරුද්ද :
අදාළ වෘත්තියේ රජයේ හෝ පිළිගත් ආයතනයක අවුරුදු 02ක පළපුරුද්දක් ලබාතිබීම.

05. වයස් සීමාව :
අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

06. වැටුප :
මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(IV) පරිදි, වැටුප් කේත අංකය PL -2-2006 (ඒ) රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600 වැටුප් පරිමාණය හිමිවේ.

07. ඉහත තනතුර සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සියලුදෙනා විශිෂ්ඨ චරිතයකින් හා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය. ඉහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

(i) අයදුම්පත් 2016.01.18 දිනට හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත්, දෙවන පිටුව අංක 08 සිට 11 දක්වාත්, අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත්අකුරින් ම සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්න පැහැදිලිව ලියා තිබිය යුතු ය.

(iv) අයදුම්පත්‍රයට අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(v) වෘත්තීය පරීක්ෂණ ගාස්තුව රු. 400 ක් වන අතර, එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මාධ්‍ය ශාඛාවේ අංක 176 - 100- 139026228 දරන ගිණුමට බැරකර දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

(vi) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතීඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 20,030 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(vii) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(viii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් සහ නියමාකාරයෙන් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ix) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/2014 හා විධිවිධාන අනුව රාජ්‍ය භාෂාව පිළිබඳව අදළ ප්‍රවීණතා මට්ටම ලබාගත යුතු ය.

10. වෘත්තීය පරීක්ෂණ පරිපාටිය :

(i) විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක වෘත්තීය පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය

ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) මෙම වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iii) පරීක්ෂණ නිලධාරියා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා,
- (අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
- (ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය; හෝ

පමණක් පිළිගැනේ.

(iv) වෘත්තීය පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

11. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලයක වුව ද සේවය කිරීමට හැකි විය යුතු ය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද රජය හෝ රේඛීය අමාත්‍යංශය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසිවලට ද යටත් විය යුතු ය.

(iv) අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා විධිවිධාන අදාළ වේ.

12. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ජේ. ඒ. රංජිත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 10,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ
දෙපාර්තමේන්තුවේ දී ය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

***ආදර්ශ අයදුම්පත්‍රය***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ නම :
   (i) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.
   දුරකථන අංකය :—————.

   (ii) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
   පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.
   දුරකථන අංකය :—————.
   (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)

3. උපන් දිනය ෘ

අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ෘ

අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් ෘ

අ.පො.ස. (සා. පෙළ) විභාගය

*වර්ෂය :————. විභාගය අංකය :————.*

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් ෘ

| *විභාගය/සහතික පත්‍ර පාඨමාලාව* | *වර්ෂය* | *පෙනී සිටි විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර ෘ

| *සේවය කළ ආයතන* | *තනතුර* | *සේවය කළ කාලය* | *රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය/ පෞද්ගලික අංශය යන වග* |
|---|---|---|---|
| | | | |

11. (i) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න.

(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න.) :————.

(ii) ජන වර්ගය : (කොටුව තුළ නියමිත අංකය සටහන් කරන්න)

සිංහල - 1 ශ්‍රී ලංකා දෙමළ - 2 ශ්‍රී ලංකා මුස්ලිම් - 3 ☐

ඉන්දියානු සම්භවයක් ඇති - 4 වෙනත් - 5

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේද? :————.

13. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :————.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

15. වෘත්තීය පරීක්ෂණ ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………………… මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ……… දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන……………………... මයා/මිය/මෙනවිය දැනට………… තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, නියමිත වෘත්තීය පරීක්ෂණ ගාස්තුව ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අලවා ඇති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

12-542

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා 2016.01.18 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | - III ශ්‍රේණිය |
| අධීක්ෂණ කළමනාකරු (පාලම්) | - III ශ්‍රේණිය |
| අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | - III ශ්‍රේණිය |
| අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | - III ශ්‍රේණිය |
| අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | - III ශ්‍රේණිය |

02. අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.01.18 වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම්පත්‍රයේ ඉහළ ශීර්ෂයේ සඳහන් විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත්, ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

03. දුම්රිය දෙපර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවයේ ප්‍රමුඛත්වය මත පුරප්පාඩු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත දක්වා ඇති තනතුරුවලින් එක් තනතුරකට පත් කරනු ලබන අතර, පත්වීම ලද පසු තනතුරු අතර මාරුවීම් සඳහා අවසර නොදෙනු ඇත.

### I වැනි උපලේඛනය

#### විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

*04. තනතුරේ රාජකාරි ස්වභාවය :*

අධීක්ෂණ කළමනාකරු : (ස්ථිර මාර්ග)

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය මාර්ග පද්ධතිය අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේ දී අධීක්‍ෂණ කළමනාකරුවෙකුගේ කාර්යභාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු : (පාලම්)

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය පාලම් පද්ධතිය අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේ දී අධීක්‍ෂණ කළමනාකරුවෙකුගේ කාර්යභාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු : (ගොඩනැගිලි)

ගොඩනැගිලි හා ව්‍යුහයන් අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, හා පවත්වාගෙන යාමේ දී අධීක්‍ෂණ කළමනාකරුවකුගේ කාර්ය භාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු : (ධාවනාගාර)

දුම්රිය එන්ජින් හා රිය පෙට්ටි හා මැදිරිවල සිදුවන කාර්මික දෝශ හඳුනාගෙන ඒවා අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා එම ගැල් හා මැදිරි සේවයේ යෙදවීමට පෙර ධාවනය කර පරීක්‍ෂා කර සහතික කිරීම එම කාර්යයන්ට අදල යන්ත්‍ර සූත්‍ර, අමතර කොටස් යනාදිය රැස් කර ඇති ගබඩා පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම, කර්මාන්තශාලාවල අදාළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම ආදී කටයුතුවල අධීක්ෂණ කළමනාකරුවෙකුගේ සියලු කාර්යභාරයන් ඉටුකිරීම.

අධීක්ෂණ කළමනාකරු : (කර්මාන්තශාලා)

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් එන්ජින් ගැල් මැදිරි ඇතුළු අනෙකුත් යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම අදාළ පරිදි අවශ්‍ය අමතර කොටස් අළුතින් නිෂ්පාදනය කිරීම සහ අළුත් වැඩියාවෙන් පසුව එම දුම්රිය එන්ජින් මැදිරි ධාවනය කර සහතික කිරීම එම කාර්යයන්ට අදාළ යන්ත්‍ර සූත්‍ර, අමතර කොටස් යනාදිය රැස්කර ඇති ගබඩා පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම, කර්මාන්තශාලාවල අදාළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම ආදී කටයුතුවල අධීක්ෂණ කළමනාකරුවෙකුගේ සියලු කාර්ය භාරයන් ඉටුකිරීම.

*05. වැටුප් පරිමාණය :*

(i) (MN -3-2006-A) රු. 15,005 - 4 x180 - 6x 240 -11 x320 - 20 x 360 - රු. 27,885 වේ.

(ii) මීට අමතරව රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුපට අමතරව ගෙවනු ලබන අනෙකුත් දීමනා සඳහා ද හිමිකම් ඇත.

(iii) අසනීප වී රෝහල් ගතවීමට සිදුවන අවස්ථාවල දී ''අග්‍රහාර'' රක්ෂණ ආවරණය යටතේ වැය වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකිය.

(iv) සේවා අවශ්‍යතාව අනුව නිල නිවාස ලබා ගැනීමට හිමිකම් පවතී.

06. *(අ) අධ්‍යාපන සුදුසුකම් ඃ*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම ;

සහ

(ii) ව්‍යාවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂයධාරාවන්ට අයත් විෂයයන් තුනකින් (03) කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

*(ආ) වෘත්තීය සුදුසුකම් ඃ*

ඉහත (අ) i හා ii හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

(i) මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව;

*(ඇ) වෙනත් සුදුසුකම් ඃ*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය,
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය.
(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන.*—මෙම ගැසට් පත්‍රයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

*07. බඳවා ගැනීමේ ක්‍රමය :*

ඉහත (06) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

08. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය ඃ*

(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය ඃ*

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.
(ආ) සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (06) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(iii) *විභාගයේ විෂයයන් ඃ*

(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
(ආ) තාක්ෂණ දැනුම

(iv) *විෂයය නිර්දේශය :*

(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය
කාලය පැය 1 යි, ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණය සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ආ) තාක්ෂණ දැනුම
කාලය පැය 03 යි. ලකුණු 100 යි.

බඳවා ගැනීමේ සුදුසුකම ලෙස දක්වා ඇති ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය හෝ සමාන සහතිකලාභියකු සතුව පැවතිය යුතු තාක්‍ෂණික දැනුම් මට්ටම හා ඉදිකිරීමේ දී හා නඩත්තු ක්ෂේත්‍රයේ දී භාවිතා කරනු ලබන නවීන යන්ත්‍රසූත්‍රවල ක්‍රියාකාරිත්වය පිළිබඳව ඇති දැනුම පරීක්‍ෂා කෙරෙන ආකාරයේ ප්‍රශ්න ඇතුළත් කෙරෙනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

09. *තේරීම් පරිපාටිය :*

එක් එක් විෂයකින් ලකුණු 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ. මෙම සම්මුඛ පරීක්‍ෂණයේ දී ලකුණු දීමක් සිදු නොකරනු ලැබේ. අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව එක් එක් තනතුරු සඳහා පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 08 හි iv යටතේ දක්වා ඇති කරුණුවලට

යටත්ව විභාගයේ ඉහලම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙල අනුවය.

10. *අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :*

(i) අයදුම්පත A 4 (යතුරුලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය.

(අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)

*අයදුම්පතේ:*

1 වැනි පිටුවේ 01 සිට 08 තෙක් කරුණු ද,

2 වැනි පිටුවේ 09 සිට 12 - තෙක් කරුණු ද,

3 වැනි පිටුවේ අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඇතුළත් විය යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 500කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇමිණිය යුතු ය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද, විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

(iii) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමණාකරණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" යන්න සඳහන් කරන්න.

(iv) බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම.

අයදුම්පත්‍රයේද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, ඉල්ලුම් කරන නගරය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(vii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(viii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි.

(ix) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. අපේක්ෂකයෙකු තමාට

නියමකර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(x) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

10. 1. විභාග ප්‍රතිඵල :

නිවේදනයේ 09 ඡේදයේ දක්වා ඇති පරිදි විෂයයන් දෙකෙන්ම එක් එක් විෂයයට ලකුණු 40%ට නොඅඩුව ලැබූ අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් කුසලතා අනුපිළිවෙලට සකස්කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබාදෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www. results. exams. gov.lk වෙබ් අඩවියේ පළකරනු ඇත.

11. සේවා කොන්දේසි :

බඳවා ගනු ලබන්නේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ III වැනි ශ්‍රේණියට වන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

12. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටියි.

13. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වේ.

14. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇත්තේ නම් එවැනි විටක දී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිතා කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයදුම්පත්‍රය

දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015
External Recruitment for The Post In Railway Supervisory Management Service Grade III - 2015

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

1 විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2 පුරවැසිභාවය :

පරම්පරාවෙන් - 1
ලියාපදිංචිවීමෙන් - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

| විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය | නගරය | නගර අංකය |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | | |

01. මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(උදා. : PERERA, R. M. D. C.P. A.)

02. මුල'කුරුවලින් හැඳින්වෙන නම් :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී 1
පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ජන වර්ගය
සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3
මුස්ලිම් - 4 / බර්ගර් - 5 / මැලේ - 6

(අදළ අංකය කොටුව තුළ ලියන්න)

07. පදිංචිය :

(i) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————. එහි අංකය : ☐

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(iii) දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

09. දුරකථන අංකය :————.

10. 2016.01.18 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

11. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ. පො. ස. (සා. පෙළ.)

විභාග අංකය:————. වර්ෂය :————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |
| (v) | | |
| (vi) | | |
| (vii) | | |
| (viii) | | |
| (ix) | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) :

විභාග අංකය :————. වර්ෂය:————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

(iii) වෘත්තීය සුදුසුකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? :————.

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුව තුළ " X " ලකුණු යොදන්න)

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ………… දින තැපැල් කාර්යාලයට රු.500ක් ගෙවා ලබාගත් අංක …… දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් අලවන්න. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා, මම පුද්ගලිකව හඳුනමි. ඔහු ……………… දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
සහතිකකරන අයගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

15. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ……………………… මහතා ………………… දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ………… දින සිට ………… දින දක්වා ……………………… වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ තනතුරක් සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

12-588

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගන්නා තනතුර — පුරප්පාඩු ගණන — ශ්‍රේණිය
මැනුම් උපකරණ කාර්මික ශිල්පී — 01 — III ශ්‍රේණිය

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය

- මිනුම් කටයුතුවලට අදාළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම හා සේවා කිරීම

2.0 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප* :-

වගුව - අංක 01 -

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු. 14,425 - 10 x 145 - 11 x 170 -6 x 240 - 14 x 320 - රු. 23,665 (එම්ටී 1 - 2006ඒ) | රු. 14,425 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 14,425 - 10 x 145 - 11 x 170 -6 x 240 - 14 x 320 - රු. 23,665 (එම්ටී1-2006ඒ) | රු. 16,045 |
| I ශ්‍රේණිය | මාසිකව රු. 14,425 - 10 x 145 - 11 x 170 -6 x 240 - 14 x 320 - රු. 23,665 (එම්ටී 1 - 2006ඒ) | රු. 17,985 |

4.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

5.0 සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම්
අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම

5.2 වෘත්තීය සුදුසුකම්
රජය පිළිගත් කාර්මික විද්‍යාලයකින් ඉලෙක්ට්‍රොනික් හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වූ NVQ 5 මට්ටමේ පාඨමාලාවක් හදාරා තිබීම.

5.3 පළපුරුද්ද
අදාළ ක්ෂේත්‍රයේ වසර 06ක පලපුරුද්දක් ලබා ඇති දෙපාර්තමේන්තු සේවකයෙක් වීම.

5.4 කායික සුදුසුකම්
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.5 වෙනත්
තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන* :
සෑම අයදුම්කරුවෙකුට තනතුරට අදළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම* :

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත්කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන්කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

7.0 *විභාග පරිපාටිය* :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| I බුද්ධි පරීක්ෂණය | 100% | 40% | පැය 01 |
| II තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100% | 40% | පැය 02 |

8.0 *තේරීම් පරිපාටිය* :

8.1 සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

09.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම* :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතු ය. අංක 01 සිට 05 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 06 - 09.1 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 09.2 - 12 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 13 - 15 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) ඉල්ලුම්කරුවන් අයදුම්පත් සිය ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

09.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "**මැනුම් උපකරණ කාර්මික ශිල්පී - සීමිත තරග විභාගය**" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

10. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 300 කි. මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. *අයදුම්පත්‍ර යොමු කිරීම* :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 ජනවාරි 18 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

සර්වේයර් ජනරාල්,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 506,
කොළඹ.

12.0 *විභාගයට පෙනී සිටීම* :
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

13.0 *අපේක්ෂකයන්ගේ අනන්‍යතාව* :
විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2015 නොවැම්බර් මස 26 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය***

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටු තුළ අක්ෂරය යොදන්න.)

02. මුලකුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය

වර්ෂය :————. මාසය :————. දිනය :————.

04.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස

වර්ෂය :————. මාසය :————. දිනය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M ස්ත්‍රී - F)

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

06.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : දිස්ත්‍රික්කයේ නම :

06.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවද සිට ද ? :————.

07. වෘත්තීය සුදුසුකම් :————.

07.1 පළපුරුද්ද :————.

08. 08.1 දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු තනතුර හා දිනය :————.

08.2 සේවක අංකය :————.

08.3 එම තනතුරේ සේවය ස්ථිර කර තිබේ ද? :————.

08.4 සේවා කාලය තුළ විනය දඬුවම් ලබා තිබේ ද? :————.

08.4.1. පිළිතුර 'ඔව්' නම් ඒ පිළිබඳ තොරතුරු :————.

08.5 ආරම්භක තනතුරෙන් පසු වෙනත් තනතුරුවලට පත් වී තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු :

| තනතුර | පත් වූ දිනය | සේවයේ ස්ථිරත්වය |
|---|---|---|
| | | |

09. *අධ්‍යාපන සුදුසුකම්* :

9.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

09.2 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

දෙවනවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :—

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

10. වෙනත් සුදුසුකම් :————.

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත ☐

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

13. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) රු. ............ක් ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........... දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :*

නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කරන ලදී. ඔහු/ඇය විසින් මෙහි අංක 08 සහ 09 ශීර්ෂ යටතේ ලබාදී ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් වත්මන් තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 06.1 හි සඳහන් ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| | *නගරය/දිස්ත්‍රික්ක නාම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|---|
| 1. | කොළඹ | 01 |
| 2. | ගම්පහ | 02 |
| 3. | කළුතර | 03 |
| 4. | මහනුවර | 04 |
| 5. | මාතලේ | 05 |
| 6. | නුවරඑළිය | 06 |
| 7. | ගාල්ල | 07 |
| 8. | මාතර | 08 |
| 9. | හම්බන්තොට | 09 |
| 10. | කුරුණෑගල | 10 |
| 11. | පුත්තලම | 11 |
| 12. | අනුරාධපුර | 12 |
| 13. | පොළොන්නරුව | 13 |
| 14. | බදුල්ල | 14 |
| 15. | මොණරාගල | 15 |
| 16. | රත්නපුර | 16 |
| 17. | කෑගල්ල | 17 |
| 18. | අම්පාර | 18 |
| 19. | මඩකලපුව | 19 |
| 20. | ත්‍රිකුණාමලය | 20 |
| 21. | යාපනය | 21 |
| 22. | වවුනියාව | 22 |

10-525/1

---

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු ගණන : 07

2. තනතුරේ ස්වභාවය :
මැනුම් කටයුතුවලට අදාළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම සහ සේවා කිරීම.

3. (i) පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර :

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100% | 40% |

(ii) මෙම ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව මත තේරීම් කරනු ලැබේ.

4. *බඳවා ගැනීමේ ශ්‍රේණිය :*

මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරේ III ශ්‍රේණිය

5. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර තෝරා ගනු ලබන නිලධාරීන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම ගැසට් නිවේදනය ආරම්භයේ ඇති රාජ්‍ය සේවයේ පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

6. *වැටුප් පරිමාණය :*

MT1-2006-A- රු. 14,425-10x145-11x170-6x240-14x320-රු. 23,665

ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | රු. 14,425 |
| II ශ්‍රේණිය | පියවර 12 | රු. 16,045 |
| I ශ්‍රේණිය | පියවර 23 | රු. 17,985 |

7. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර වයස 35ට නොවැඩි විය යුතුය.

8. *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව
2. ගණිතය

සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම් :*

මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරට අදාළව ඉලෙක්ට්‍රොනික් හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ වූ NVQ 5 මට්ටමේ පාඨමාලාවක් හදරා තිබීම.

9. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගේ පුරප්පාඩු සංඛ්‍යාව මත පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

10. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර :*

(*අ*) (i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම් පත්‍ර සකසාගත යුතු අතර, ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 08 දක්වාත්, 02 වන පිටුවේ අංක 09 සිට 12 දක්වාත්, 03 වන පිටුවේ අංක 13 සිට 16 දක්වාත් ඡේදයන් ඇතුළත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර'' යනුවෙන් සඳහන්කර 2016 ජනවාරි 18 දින හෝ ඊට පෙර ''මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

(ii) අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

(iv) මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

(v) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව වෘත්තීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

12. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක්,
(iv) චරිත සහතික දෙකක්.

*සැලකිය යුතුයි.*-අධ්‍යාපන, වෘත්තීය හා උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත්කළ යුතුය.

13. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

14. විභාග ගාස්තුව රු. 800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතුය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

15. විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

16. *විභාගයට ඇතුළුවීම :*
අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත්කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතුය.

***සටහන***-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

17. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*
විභාග ශාලාවේ දී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත,
(ආ) තැපැල්පති විසින් නිකුත්කර ඇති වලංගු හැඳුනුම්පත,
(ඇ) වලංගු ගමන් බලපත්‍රය.

18. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*
අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එහි සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

19. *භාෂා මාධ්‍යය :*
මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර, අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම් පත්‍රයේ සඳහන්කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

20. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2015 නොවැම්බර් 06 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා වන විවෘත තරග විභාගය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(දෙන ලද කොටු තුළ සංකේත අංක යොදන්න)

01. 1. මුලකුරු සමග නම :
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

02. (i) ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරෙන්) :————.

(ii) ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F)

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)

(5) ජන වර්ගය :
(සිංහල - 1, ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2, මුස්ලිම් - 3, ඉන්දියානු ද්‍රවිඩ - 4, බර්ගර් - 5, මැලේ - 6, වෙනත් - 7)

(6) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
(iii) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

(7) පුරවැසිභාවය :

පරම්පරාවෙන් :

ලියාපදිංචි වීමෙන් :

(8) ජාතික හැඳුනුම්පත් අංකය :————.

(9) (i) උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂය :————. මාසය :————. දින :————.

10. අධ්‍යාපන සුදුසුකම් :————.

10.1 අ. පො. ස. (සා. පෙ.) පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

10.2 අ. පො. ස. (සා. පෙ.) දෙවනවර ඃ

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :—

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ඃ ☐ නැත ඃ ☐

ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

(13) මුදල් ගෙවන ලද මිනින්දෝරු කාර්යාලය ඃ
රිසිට්පත් අංකය :————.
මුදල් ගෙවන ලද දිනය :————.

(14) *අයදුම්කරුගේ සහතිකය ඃ*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශ අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) රු. ………… ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා ඇත.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........... දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන්නාගේ නම :—————.

තනතුර :—————.

ලිපිනය :—————.

(කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.)

16. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ*

තෝරාගනු ලැබුවහොත් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

12-525/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.